# බෞද්ධ
# විනය අධ්‍යයන


ප්‍රධාන සංස්කාරක

කොටපිටියේ රාහුල හිමි

සහාය සංස්කාරකවරු

ආචාර්ය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි

රාජකීය පණ්ඩිත පත්බේරියේ විමලඤාණ නාහිමි

ශාස්ත්‍රපති අමුතාගොඩ ඉන්දරතන නාහිමි



කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ

150 වන සංවත්සරය නිමිත්තෙන් නිකුත් කෙරෙන ශාස්ත්‍රීය සංග්‍රහය

2550-2006

© සියලු හිමිකම් ඇවිරිණි.

ප්‍රථම මුද්‍රණය 2006

ISBN 955-1492-00-5

**ප්‍රකාශනය**

කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව

රජ මහවිහාරය

කෝට්ටේ

**පරිඝණක අකුරු ඇමුණුම සහ මුද්‍රණය**

සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ

67, කාර්මික ජනපදය

කටුවාන පාර, හෝමාගම

# කායික රෝග සහ විනයානුකූල වෛද්‍යකම

කථිකාචාර්ය කනත්තේගොඩ සද්ධාරතන හිමි

පෙරපර දෙදිග වෛද්‍ය විද්‍යාවට අනුව සත්ත්වයාට වැළඳෙන රෝග මූලික වශයෙන් කොටස් දෙකකට වෙන් කොටගෙන අධ්‍යයනය කරනු ලබයි. එනම් කායික රෝග හා මානසික රෝග යනුවෙනි. බුදුන්වහන්සේ ද එදා සත්ත්වයාට වැළඳෙන රෝග මූලික වශයෙන් කොටස් දෙකකට වෙන් කොට දක්වා ඇති බව රෝග සූත්‍රයෙන් මනාව පැහැදිලි වේ. එනම් කායික රෝග හා චෛතසික (මානසික) රෝග[1] යනුවෙනි. මෙහිදී අපගේ මූලික අවධානය යොමු කෙරෙනුයේ කායික රෝග සඳහා බුදුරජාණන්වහන්සේ නියම කළ ඖෂධ, ප්‍රතිකාර හා පථ්‍යාපථ්‍ය ආහාර පිළිබඳ ව ගවේෂණය කිරීම යි. භික්ෂූන්වහන්සේලාට කායික රෝග වැළඳි අවස්ථාවල දී එම රෝග සඳහා නියම කළ ඖෂධ ප්‍රතිකාර හා පථ්‍යාහාර පිළිබඳ දීර්ඝ විස්තරයක් විනය පිටක මහාවග්ග පාළි භේසජ්ජක්ඛන්ධකයේ සඳහන් වී ඇත. එම දේශනා ඇසුරුකර ගනිමින් වෛද්‍යකම පිළිබඳව උන්වහන්සේ තුළ පැවති උසස් දැනුම හෙවත් විශේෂඥභාවය ප්‍රකට කළ හැකි ය. භෙසජ්ජක්ඛන්ධකයේ සඳහන් වන කරුණු පිළිබඳ ව විමසිලිමත් ව බලන්නෙකුට උන්වහන්සේ තුළ වෛද්‍යකම පිළිබඳ ව පැවැති දැනුම ප්‍රකට කරන්නට මෙසේ කරුණු වර්ග කළ හැකි ය.

- රෝගී වූ භික්ෂූන් සඳහා බුදුන්වහන්සේ ම ඖෂධ නියම කිරීම.
- වෙනත් වෛද්‍යවරයෙකු නියම කළ ඖෂධ අනුමත කිරීම.
- වෙනත් වෛද්‍යවරයෙකු නියම කළ සුදුසු නොවන ආහාර හා ප්‍රතිකාර ප්‍රතික්ෂේප කිරීම.
- විවිධ පාන වර්ග ඇතුළත් ගිලන්පස තුළින් ශරීර සෞඛ්‍ය පවත්වා ගෙන යාම.

බුද්ධකාලීන භාරතයේ සිටි ජීවක වෛද්‍යවරයා නියම කරන ලද ඖෂධ හා ප්‍රතිකාර බොහෝමයක් පිළිබඳව මහාවග්ග පාලියේ සඳහන් වේ. ඊට අමතරව බුදුන්වහන්සේ නියම කළ ඖෂධ හා ප්‍රතිකාර පිළිබඳවත් සඳහන් වන අතර උන්වහන්සේ ප්‍රතික්ෂේප කළ ඖෂධ හා ප්‍රතිකාර පිළිබඳවත් සඳහන් වේ. උන්වහන්සේ ගිලනුන්ගේ කායික රෝග සඳහා නියම කළ බෙහෙත් වර්ගකර දක්වා තිබේ. ඒවා සත්ව තෙල් (වසා භෙසජ්ජ) මුල් බෙහෙත් (මූල භෙසජ්ජ) කසාය බෙහෙත් (කසාව භෙසජ්ජ) කොළ බෙහෙත් (පණ්ණ භෙසජ්ජ) ඵල බෙහෙත් (ඵල භෙසජ්ජ) මැලියම් බෙහෙත් (ජතු භෙසජ්ජ) ලුණු බෙහෙත් (ලොණ භෙසජ්ජ) යනුවෙන් විවිධ වර්ගවල බෙහෙත් පිළිබඳව මහාවග්ග පාලි භෙසජ්ජක්ඛන්ධකයේ පැහැදිලි කරයි. මෙසේ කාණ්ඩ යටතේ බෙහෙත් වර්ගීකරණය වී ඇත්තේ ඒ සඳහා යොදාගත් අමුද්‍රව්‍යයේ නාමය මූලික කොටගෙන බව පෙනේ. යම් රෝගයකට ඖෂධ සකස්කර ගැනීමේ දී ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස ශාක මුල් භාවිත කළේ නම් එය මූල භෙසජ්ජ වූවා විය හැකි ය. කෙසේ නමුත් එම ඖෂධ කාණ්ඩ පිළිබඳව වෙන වෙන ම මෙසේ හඳුන්වා දිය හැකි ය.

සත්ත්ව තෙල් බෙහෙත් හෙවත් වසා භෙසජ්ජ වුරුණු බෙහෙත් නමින් ද හැඳින්වේ. සත්ත්ව මාංසයෙන් සකස්කර ගනු ලබන තෙල් විශේෂයකි. භික්ෂූන් වහන්සේලාට වැළඳුණු කායික රෝග සඳහා ප්‍රතිකාර කිරීමේ දී වෙනත් බෙහෙත් සමඟ මිශ්‍රකර ගැනීමට සත්ත්ව තෙල් අවශ්‍ය විය. එම අවස්ථාව මනා ව අවබෝධකරගත් බුදුන්වහන්සේ භික්ෂූන්ගේ ප්‍රයෝජනයට ගත හැකි සත්ත්ව තෙල් වර්ග පහක් භෙසජ්ජක්ඛන්ධකයේ දී නාමිකව දක්වා ඇත. වලස් තෙල්, මත්ස්‍ය තෙල්, සූසුකා තෙල් හෙවත් කිඹුල් තෙල්, ඌරු තෙල්, කොරළු තෙල්[2] යනුවෙනි. භික්ෂූන් සඳහා තහනම් කළ මස්වල වුව ද තෙල් භාවිතයට ගැනීමට අවසර ලබා දී ඇති බව සමන්තපාසාදිකා විස්තරයෙන් පෙනේ. ඉහත සඳහන් තෙල් වර්ග පහ පිළිබඳ ව විග්‍රහයක් කරන සමන්තපාසාදිකාව නම් විනය අටුවා ග්‍රන්ථය මනුෂ්‍ය තෙල් හැර වලස් තෙල් ඇතුළු සියලු අකැප මස්වල තෙල් බුදුන්වහන්සේ අනුදැන වදාරා ඇතැයි පෙන්වා දෙයි.[3] මත්ස්‍ය තෙල් පිළිබඳ ව සඳහන් කිරීමේ දී සූසුකා මත්ස්‍ය තෙල් පිළිබඳ ව වෙන ම දක්වන්නේ දරුණු සතෙකු වන හෙයින් බව ද සඳහන් කර තිබේ. මස් වර්ග අතරින් මනුෂ්‍ය, හස්ති, අශ්ව, සුනඛ, අහි (සර්ප), සිංහ, ව්‍යාඝ්‍ර, දීප, වලස්, කළු හිස් වලස් යන මස් වර්ග වැළඳීම තහනම් බවත් එහෙත් සියලු කිරි වර්ග කැප බවත් දක්වා තිබේ.[4] පෙරදිග වෙදකමේ දී වසා හෙවත් සත්ව තෙල් භාවිත කොට ඇති බව අෂ්ටාංග හෘදය සූත්‍රය පැහැදිලි කරයි. සත්ව තෙල් වැඩි වශයෙන් භාවිත

කොට ඇත්තේ සන්ධිගත රෝග, නාඩිගත රෝග, වාතගත රෝග මෙන් ම දරුණු පිළිස්සීම්වල දී ය. එසේ ම කැඩුම් බිඳුම්, කැපීම් සඳහා ද වුරුණු තෙල් භාවිත කොට තිබේ.[5] අතීතයේ ඖෂධයක් වශයෙන් මෙන් ම ශරීරය පෝෂණය කිරීමේ ආහාරයක් ලෙස ද සත්ව තෙල් භාවිත කළ ද වර්තමානයේ සත්ව තෙල් භාවිතය ඉතා ම අඩු බව පෙනේ. එහෙත් පෙර අපර දෙදිග වෛද්‍ය ක්‍රම තුළ සත්ව තෙල් අද ද භාවිත කෙරේ. බටහිර වෛද්‍ය ක්‍රමයේ ඉතා වටිනා ඖෂධයක් ලෙස භාවිත කරන "කොඩ්ලිවර් ඔයිල්" යනු මත්ස්‍ය තෙලකි. මෙම තෙල උපයෝගී කරගෙන සාදා ඇති ඖෂධය මෝර ගුලි හෙවත් මෝර තෙල් යනුවෙන් සාමාන්‍ය ජනතාව ව්‍යවහාර කරති. මේ හැර දැනුදු ලක්දිව ඇතැම් ප්‍රදේශවල ඉපැරණි වට්ටෝරු අනුව උක්ත සත්ව තෙල් යොදාගන්නා බව පෙනේ ඇදුම රෝගය සඳහා කොටි (දීප) තෙල් භාවිතයට ගැනේ.[6]

ගස්වල මුල්වලින් සකස්කර ගන්නා ඖෂධ මූලභෙසජ්ජ නමින් හැඳින්වේ. ගිලන් වූ භික්ෂූන් සඳහා මුල් වලින් සකස්කර ගන්නා බෙහෙත් අවශ්‍ය විය. එම අවශ්‍යතාව හඳුනාගත් බුදුන්වහන්සේ මුල් බෙහෙත් අනුදැන වදාළ සේක. කහ, ඉඟුරු, වදකහ, හෙළ වදකහ, අතිවිඩයන්, කුළු රැණ, සුවඳහොට, වම්මුතු යන බෙහෙත් ද ඊට අමතර ව තවත් ප්‍රයෝජනවත් මුල් බෙහෙත් වේ නම් වළඳන්නට, ප්‍රයෝජනයට ගන්නට අනුදාන වදාළ සේක.[7] මෙම මුල් බෙහෙත් පිටිකර ප්‍රයෝජනයට ගන්නට දාගල (ඇඹරුම්ගල) සහ දරුගල ද බුදුන්වහන්සේ මෙහි දී අනුදැන වදාළ හ. මූල භෙසජ්ජ පෙරපර දෙදිග වෛද්‍ය ක්‍රමවල ඖෂධ සකස්කර ගැනීමේ මූලික අමුද්‍රව්‍යයක් ලෙස භාවිත කෙරේ. විශේෂයෙන් පෙරදිග වෛද්‍ය ක්‍රමයේ දී මුල් බෙහෙත් බහුල වශයෙන් භාවිතයට ගන්නා බව සාරාර්ථ සංග්‍රහ ග්‍රන්ථයේ දැක් වේ. කහ, ශෘඞ්ගිවේර, අමු ඉඟුරු, වදකහ, අතිවිඩයම්, කටුකරෝෂණ, සැවැන්දරා, කලාදුරු ආදී මුල්බෙහෙත් දිනපතා බෙහෙත් කිරීමේ දී උපයෝගී කරගන්නා බව කිය වේ. එසේ ම අත් බෙහෙත් කෙම් බෙහෙත් ආදිය සාදා ගැනීමේ දී ද, ඉහත සඳහන් මුල් වර්ග බහුල වශයෙන් උපයෝගී කර ගනී. සාරාර්ථ සංග්‍රහය දක්වන පරිදි ඉහත සඳහන් මුල් වර්ග අලවර්ග උපයෝගී කරගෙන සකස් කරගත් බෙහෙත් අජීර්ණ රෝග, අතීසාරය, ආම අතීසාරය, රක්ත දෝෂ වැනි රෝග පීඩා සඳහා ප්‍රත්‍යක්ෂ ඖෂධයෝ වෙති. එසේ ම බඩ පිපුම සෙම් දොස් නැසුමට මෙන් ම ශරීර සැහැල්ලු බව ඇති කිරීමට ද ඉඟුරු වැනි ඖෂධ ප්‍රයෝජනවත් වේ.

පෙළ දහමෙහි කසාවභේසජ්ජ නමින් හඳුන්වා ඇත්තේ කසාය බෙහෙත් වේ. කෂාය බෙහෙත් යනු ගස්වල කොටස් උපයෝගී කරගෙන වතුර දමා

සකස්කර ගන්නා ඖෂධයෙකි. භික්ෂූන්ට කෂාය බෙහෙත්වල අවශ්‍යතාව වටහාගත් බුදුන්වහන්සේ කසට බෙහෙත් කිහිපයක් නාමිකව දක්වා ඊට අමතර ව තවත් අවශ්‍ය කසට බෙහෙත් ප්‍රයෝජනයට ගැනීම සඳහා අවසර ලබා දී ඇත. ඛන්ධක විනයෙහි නාමික ව දක්වා ඇති කෂාය බෙහෙත් වශයෙන් කොහොඹ කෂාය, කෙළිඳ කෂාය, දුම්මැල්ල කෂාය, හඟුල කෂාය, කරද කෂාය[8] දැක්විය හැකි ය.

සිංහල වෙදකමට හුරුකමක් ඇති අයට කෂාය බෙහෙත් අමුතුවෙන් හඳුන්වාදීම අවශ්‍ය නොවනු ඇත. පෙරදිග වෙදකමේ බහුල වූ ප්‍රතිකාර ක්‍රමයක් වශයෙන් කෂාය ඖෂධ ක්‍රමය භාවිතයට ගැනේ. කෂාය පංච විධ බව ආයුර්වේදයේ මතය වේ. ස්වර කෂාය, කල්ක කෂාය, ක්වාථ කෂාය, හිම කෂාය, ඵාණ්ට කෂාය[9] වශයෙනි. කොළ, දළු, පොතු, මල්, මුල් ආදී අමුද්‍රව්‍ය තලා මිරිකා පෙරාගත් කල ස්වර කෂාය නම් වේ. වණ්ඩුවෙන් හෝ උණුඅළුවෙන් තම්බා පෙරාගැනුම ද මෙයට ම අයත් වේ. ඖෂධ ද්‍රව්‍ය ගෙන උණුවතුර, ඇල්වතුර, ඉඟුරු යුෂ, ඇඹුල් දොඩම් යුෂ ආදී ද්‍රව්‍ය වර්ගයකින් ඇඹරීමෙන් හෝ ගලගා ගැනීමෙන් කලං දෙකක් පමණ ගෙන උණුවතුර අවුන්ස දෙකක් දමා වසා තබා පෙරාගත් ජලය කල්ක කෂාය නම් වේ. ඖෂධ ද්‍රව්‍ය කලං දොළහක් ගෙන වතුර පත අටක් දමා පත එකට සිඳුවා පෙරාගත් ජලය ක්වාථ කෂාය නම් වේ. ඖෂධ කලං 12ක් ගෙන කපා කොටා තලා වතුර පතක් දමා රැයක් තබා පෙරාගත් ජලය හිම කෂාය නම් වේ. ඖෂධ කලං 12ක් ගෙන කපා කොටා තලා උණුවතුර පතකට දමා වසා තබා පෙරාගත් ජලය ඵාණ්ට කෂාය නම් වේ.[10]

බුදුන්වහන්සේ නියමකරන ලද කෂාය බෙහෙත් එදත් අදත් පෙරදිග වෛද්‍ය ක්‍රමය තුළ භාවිත කරන බව පැහැදිලි ය. කොහොඹ ප්‍රධාන ඖෂධය ලෙස යොදාගත් කෂාය වාතරක්ත, චර්ම රෝග, දද, පණු කැවිලි, බිබිලි, කුෂ්ට යන රෝග සඳහා ද භාවිත කරන ප්‍රසිද්ධ කෂායකි.[11] මෙම කෂාය කොහොඹ කෂාය හෙවත් නිම්බ කෂාය නමින් හැඳින් වේ.

කෙළිඳ ප්‍රධාන කොටගත් ඖෂධ සංයෝගයෙන් සකස්කර ගන්නා කෂාය ආමාතීසාර, රක්තාතීසාර, උදරවේදනා නැසුමට යෝග්‍ය ඖෂධයක් බව කියවේ. මෙම කෂාය කෙළිඳ කෂාය නම් වේ.[12] දුම්මැල්ල ප්‍රධාන කොටගත් ඖෂධ සංයෝගයෙන් සකස් කරගත් කෂාය මැලේරියා උණට ඉතා යෝග්‍ය වන අතර සාමාන්‍ය උණ බැස යාමට ද පිළියමකි.[13] කරඳ ප්‍රධාන ඖෂධ සංයෝගයෙන් සකස් කරගන්නා කෂාය ගුදකීල, අර්ශස්, භගන්දරා ආදී රෝග සඳහා යෝග්‍ය ප්‍රතිකර්ම ලෙස පෙරදිග වෙදකම විස්තර කරයි.

මෙම ඖෂධ සියල්ලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ මනා පරිචයක් බුදුන්වහන්සේ තුළ පැවැති බව පෙනේ.

පණ්ණභෙසජ්ජ යනු ගස්වල කොළ වර්ග ගෙන සකස් කරගන්නා ඖෂධයෙකි. බුදුන්වහන්සේ ඖෂධ සඳහා භාවිත කළ කොළ වර්ග කිහිපයක නම් භෙසජ්ජක්ඛන්ධකයේ දී දක්වා ඇත. එනම් කොහොඹ කොළ, කෙළිඳ කොළ, දුම්මැල්ල කොළ, තලා කොළ, කපු කොළ මෙයට අමතර ව ඖෂධ සඳහා භාවිත වන වෙනත් කොළ වර්ග භාවිතයට අවස්ථාව සලසා ඇත. පෙරදිග වෙදකමේ දී ඊට අමතර ව හීන් මදුරුතලා, මහ මදුරු තලා, කළුමල් ඇති මදුරු තලා, සුදු මල් ඇති මදුරා තලා, සුවඳ තලා, පෙති තෝර, ගොටු කොළ, මුගුණු වැන්න, ආදී කොළ වර්ග, සුරසාදී ගණයට අයත් වේ. එම ගණයට අයත් බෙහෙත් භාවිතයෙන් ප්‍රතිශ්‍යාව, කැස්ස, අරුචිය, ශ්වාසය ආදී රෝග වනසාලයි. එසේ ම ශෝධනය ද කරයි.[14] කොහොඹ කොළ යුෂ ලේ පිරිසිදු කරන වැදගත් ඖෂධයක් ලෙස පෙර දිග වෛද්‍ය ක්‍රමයේ පිළිගනී. සතියකට වරක් කොහොඹ කොළ කොටා මිරිකාගත් යුෂ අවුන්ස දෙකක් පමණ උතුරුවන ලද එලකිරි සමඟ පානය කිරීමෙන් රුධිරය පිරිසිදු වේ. එසේ ම රුධිරයේ මේදකැටි දිය කරයි. දියවැඩියාව නිවාරණය කරයි. මෙය අත් බෙහෙතක් ලෙස බොහෝ ගැමියෝ භාවිත කරති. ගෙදරක තිබිය යුතු වටිනා ම ඖෂධයක් ලෙස කොහොඹ සැලකේ. බුදුසමයේ නම් වශයෙන් දක්වා ඇති කොළවර්ගවල වටිනාකම භෙසජ්ජමඤ්ජුසාව, සාරාර්ථ සංග්‍රහය, සුශ්‍රැත සංහිතාව ආදී ආයුර්වේද ග්‍රන්ථවල ද සඳහන් ව ඇත.

ගසේ පඤ්චාංගය බෙහෙත් සඳහා භාවිත කරන බව පිළිගත් මතයකි. පඤ්චාංගයෙන් එක් අංගයක් ලෙස ඵලය ද (ගෙඩි) ගැනේ. මෙයින් සකස්කර ගන්නා ලද විවිධ ඖෂධයන් ඵලභෙසජ්ජ ලෙස නම් කෙරේ. රෝගාබාධ සඳහා බෙහෙත් සකස්කර ගැනීමේ දී ඖෂධ වශයෙන් භාවිතයට ගන්නා ඵල බෙහෙත් කිහිපයක් නාමික ව දක්වමින් ඵලභේසජ්ජය අනුදැන වදාළ සේක. එනම් වළඟ සහල්, තිප්පිලි, ගම්මිරිස්, අරළු, බුළු, නෙල්ලි, ගොටුඵල[15] වශයෙනි. මෙම ඖෂධ ඵල වර්ග කුමන රෝගයක් සඳහා පැණවූයේ දැයි පැහැදිලිව දක්වා නොමැත. එහෙත් විවිධ බෙහෙත් සකසා ගැනීමේ දී මේවා භාවිතයට ගෙන තිබේ. පූතිමුත්ත භෙසජ්ජය සකසා ගැනීමේ දී මූලික ඖෂධයක් ලෙස අරළු භාවිතයට ගෙන ඇත. ඉහත දක්වන ලද ඵල බෙහෙත් වර්ග බොහොමක් පෙරදිග වෛද්‍ය ක්‍රමයේ නිරන්තරයෙන් භාවිත කෙරෙන ඖෂධ ලෙස පිළිගැනේ. මෙම බෙහෙත් භාවිතය පිළිබඳව ආයුර්වේද ග්‍රන්ථවල සඳහන් වේ.

ආයුර්වේදයේ දී තිපල් හෙවත් ත්‍රිඵලාගණය ලෙස සැලකෙන්නේ අරළු, බුළු, නෙල්ලි යන ඖෂධ තුනයි. එම ත්‍රිඵලා ගණයට අයත් ඖෂධ භාවිතයෙන් ඇස් රෝග, ප්‍රමේහ රෝග, කුෂ්ට රෝග නසාලන බව කිය වේ.[16] එසේ ම ත්‍රිකට හෙවත් තිකුළු ගණය ලෙස දක්වන්නේ තිප්පිලි, ගම්මිරිස් සහ ඉඟුරු ය. මේවා මූලික කරගත් ඖෂධ භාවිතයෙන් සෙම, මේදය, ගුල්ම, පීනස, අග්නිමාන්දම ආදී රෝග දුරුවන බව සුශ්‍රැත සංහිතාව සඳහන් කරයි.[17] වළඟ සහල් ප්‍රධාන කොටගත් ඖෂධ භාවිතයෙන් උදරශූල ක්‍රිමි රෝග දුරු කරන බවත්, ගම්මිරිස් ප්‍රධාන කොටගත් ඖෂධ භාවිතයෙන් වාත රෝග සම සෙම් රෝග දුරුකරන බවත් එහෙත් පිත්ත රෝග වැඩිකරන බවත් එසේ ම ඇදුම උදරශූල හා ක්‍රිමි රෝග දුරු කරන බවත් කියවේ. තිප්පිලි ප්‍රධාන කොටගත් ඖෂධ භාවිතයෙන් වාත සහ සෙම් රෝග දුරුකරන බව ද පැහැදිලි කරයි. වෙදකමේ දී බොහෝ කොට භාවිතයට ගන්නා ඵල බෙහෙත් පිළිබඳව බුදුරදුන් නාමිකව සඳහන්කර තිබීම තුළින් වෙදකම පිළිබඳ ව උන්වහන්සේ තුළ පැවැති විශේෂඥභාවය ප්‍රකට කරයි.

ජතුභෙසජ්ජ යනු ගස්වල මැලියම් උපයෝගී කොටගෙන සකස් කරගනු ලබන බෙහෙත් ය. මැලියම් බෙහෙත් අතර පෙරුම් කායම් ප්‍රධාන වේ. බුදුන්වහන්සේ මැලියම් බෙහෙත් කිහිපයක් නාමිකව දක්වා වෙනත් මැලියම් බෙහෙත් අවශ්‍ය වේ නම් ඒවා ද භාවිතයට ගැනීමට ඉඩ අවස්ථාව සලසා ඇත. භෙසජ්ජක්ඛන්ධකයේ නාමිකව දක්වන ලද මැලියම් බෙහෙත් මෙසේ දැක්විය හැකි ය. හිඞ්ගු (පෙරුම්කායම් ගසේ සිවියෙන් වැගිරෙන මැලියම්) හිඞ්ගු ජතු (පෙරුම්කායම් ගසේ දඬු තම්බාගත් මැලියම්) හිඞ්ගු පාටිකං (පෙරුම්කායම් ගසේ කොළ තම්බාගත් මැලියම්) තකං (පෙරුම්කායම් ගසේ කරටියෙන් වැගිරෙන මැලියම්) තක පත්තිං (පෙරුම්කායම් ගසේ කොළවලින් වැගිරෙන මැලියම්) තක පණ්ණිං (පෙරුම්කායම් ගසේ මේරු කොළ තම්බාගත් මැළියම්) සජ්ජුලං (දුම්මල)[18]

බුදුන්වහන්සේ නාමිකව අනුදැන වදාළ මැලියම් බෙහෙත් සියල්ල ම වාගේ පෙරුම්කායම් ගස හා සම්බන්ධ බව පෙනේ. පෙරුම්කායම් ගස පර්සියාව හා බටහිර ආසියාතික රටවල බහුල වශයෙන් වැඩේ. කොළ, පොතු, මුල්, කඳ හා කරටිය යන කොටස්වලින් වෙන වෙන ම මැලියම් ලබාගන්නා බව කිරිඇල්ලේ ඤාණවිමල හිමියෝ ද පැහැදිලි කරයි.[19] පෙරුම්කායම් ප්‍රධාන කොටගත් ඖෂධ භාවිතයෙන් සෙම් හා වාතරෝග සුව කරයි. එසේ ම පිත කෝප කරයි. ජීවානුනාසක ගුණයෙන් යුක්ත ය.[20] මේ නිසා අද ද මළකඩ සහිත ඇණයක් ඇණුන විට පෙරුම්කායම් බඳිනුයේ ජීවානුනාසක

ගුණය එහි ඇති බැවිනි. එසේ ම පැපොල වැනි බෝවන රෝග වැළඳුන විට රෝග බෝවීම වැළැක්වීම සඳහා විෂබීජ නාසකයක් ලෙස ද බොහෝ නිවෙස්වල පෙරුම්කායම් භාවිත කෙරේ. පෙරුම්කායම් ස්වල්පයක් එළිමහනේ තැබීම අතේ බැඳ තැබීම ආදිය මගින් විෂ හරණය සිදුකෙරේ. මේ අනුව බුදුන්වහන්සේ අනුදත් පෙරුම්කායම් මැලියම් බෙහෙත පෙරදිග වෛද්‍ය ක්‍රමයේ උසස් ඖෂධයක් ලෙස භාවිත කෙරේ.

මැලියම් බෙහෙත් අතර දුම්මලට ද සුවිශේෂ තැනක් හිමිවනු ඇත. දේශීය වෙදකමේ දී ඖෂධයක් ලෙස බොහෝ සෙයින් උපයෝගී කොට ගන්නා මෙය තුවාලවල ඔඩු කැපීම සඳහා මෙන් ම වණ පැලැස්තර සෑදීම සඳහා ද යොදා ගනිති. එසේ ම විවිධ ශාන්ති කර්මවල දී දුම් ඇල්ලීම ආදී විවිධ කටයුතු සඳහා ද දුම්මල බොහෝ සෙයින් ප්‍රයෝජනවත් වේ. මේ අනුව බුදුන්වහන්සේ ඖෂධ ලෙස දැක් වූ මැලියම් බෙහෙත අද ද පුද්ගල රෝග නිවාරණය සඳහා බෙහෙවින් භාවිත කෙරේ.

ලුණු යොදාගෙන සකසා ගන්නා බෙහෙත් ලෝණ භෙසජ්ජ යනුවෙන් හැඳින් වේ. බුදුන්වහන්සේ ඖෂධ සඳහා භාවිතයට ගන්නා ලුණු වර්ග පහක් නාමිකව මෙසේ දක්වා ඇත. සාමුද්දං (මුහුදු ලුණු), කාළ ලෝණං (කළු ලුණු), සින්ධවං (සින්ධු ජනපදයේ උපන් ලුණු), උබ්භිදං (සුවස ලුණු), බිළාලං (බළල් ලුණු)[21]

බුදුන්වහන්සේ දක්වා වදාළ මෙම ලුණු බෙහෙත් එදත් අදත් පෙරදිග වෙදකමේ දී බොහෝ සෙයින් ප්‍රයෝජනයට ගත් සහ ගන්නා ඖෂධයෝ වෙති. මෙම ඖෂධ විද්‍යාත්මක නම් යොදා බටහිර වෙදකමේ දී ද භාවිතයට ගැනේ. ලුණු වනාහි මිනිස් දිවියට අත්‍යාවශ්‍ය වූ දෙයකි. විශේෂයෙන් මුහුදු ලුණු ආහාර සකස්කර ගැනීමට අනිවාර්යයෙන් යොදාගන්නා දෙයකි. එය ඖෂධයක් මෙන් ම ආහාර සඳහා රසකාරකයක් ද වේ.

"ආහාරය සඳහා ලුණු නැතිව ම බැරි වර්ගයකි. වැඩිපුර ලුණු යෙදූ ආහාර අගුණ වේ. ලුණු ප්‍රියය. රුචිය වඩයි. සිනිඳුය. දොස් කපන ගුණයෙන් යුක්තය. මල භේදකරයි. වාතරෝග නසයි. තද උෂ්ණයක් හෝ සීතලක් නැත."[22]

සෛන්ධව ලුණු ද වෙදකමේ දී බොහෝ සෙයින් යොදාගනී. සෛයින්ධව ලුණු මඟින් සිරුර තර කරයි. ඇසට හිතකරයි. රුචිය වඩයි. තුන්දොස් සමනය කරයි. උණ රෝග හරියි. සැහැල්ලුයි.[23] මෙවැනි අනුසස් රැසක් රස

තරංගනියේ දක්වන අතර භෙසජ්ජමඤ්ජුසාව ද ඒ පිළිබඳව මෙසේ දක්වයි. තුන් දොස් සංසඳුවාලයි. ඇසට හිත වේ. සුවය ගෙන දේ. මල බද්ධය සුව කරයි. හෘදශූල ජය ගනියි.[24] එසේ ම බළල් ලුණු ආදී ලුණුවල ආනිසංස භෙසජ්ජමඤ්ජුසාවේ මෙසේ දක්වා ඇත. බළල් ලුණු අතිශයින් වාතය අනුලොම් කරයි. රෝම ලුණු ද එබඳු ආකාර ඇත්තේ ය. මුහුදු ලුණු බර ය. පාර්ශව රෝග, ඇස් රෝග, කණ්ඨ රෝග, සුව කරයි. අතිශයින් තීක්‍ෂණයි. මූලව්‍යාධියට ද කුෂ්ඨයට ද සතුරු ය.[25]

බුදුරජාණන්වහන්සේ තම ශ්‍රාවක පිරිස් ගිලන් වූ විට ප්‍රතිකාර කිරීම සඳහා යොදාගත් ඖෂධ පිළිබඳ මූලික හැඳින්වීමක් මෙහි දී සිදුකරන ලදී. උන්වහන්සේගේ අනුදැනුම පරිදි බෞද්ධ වෙදකමේ දී සත්ව තෙල්, මුල් බෙහෙත්, කෂාය බෙහෙත්, කොළ බෙහෙත්, එල බෙහෙත්, මැලියම් බෙහෙත් හා ලුණු බෙහෙත් උපයෝගී කොට ගෙන ඒ ඒ රෝග සඳහා අදාළ වෙනත් ඖෂධ ද එකතු කොට ගෙන වෙදකම් කිරීම සිදුවිණ. බුදුන්වහන්සේ භික්‍ෂූන් වහන්සේ සඳහා විවිධ රෝගාබාධ වල දී නියම කරන ලද බෙහෙත්වලින් ඒ බව පැහැදිලි වේ. මෙහි දී වඩාත් වැදගත් වනුයේ බුදුන්වහන්සේ මීට අවුරුදු දෙදහස් පන්සියකටත් අධික කාලයකට පෙර දක්වන ලද බොහෝ ඖෂධ වර්ග අදත් හස්තසාර වෙදකම් සඳහා භාවිත කිරීමයි. ඒ අනුව එම ඖෂධවල රෝග නාසක මහා ගුණයක් පවතින බව පෙනේ. බුදුන්වහන්සේ මෙම ඖෂධ වර්ග හා එම ඖෂධවල ක්‍රියාකාරීත්වය හොඳින් වටහාගෙන ඒවා භික්‍ෂූන්ට නියම කළ බව පැහැදිලි ය.

මෙම කරුණු සැලකීමේ දී බුදුන්වහන්සේ සත්වයා සසර දුකින් මිදවීම සඳහා වෙදකම් කළ මානසික වෛද්‍යවරයෙකු වූවා පමණක් නොව සත්වයාට වැළඳුනු කායික රෝග සඳහා ද මනා වූ පිළියම් කළ විශේෂඥ වෛද්‍යවරයෙකු වූහ. ඒ බව විවිධ රෝග සඳහා නියම කළ ඖෂධ හා ප්‍රතිකාර විධි පිළිබඳ ව අධ්‍යයනය කිරීමෙන් වඩාත් තහවුරු වනු ඇත. බුදුන්වහන්සේ පුද්ගලයාගේ කායික නිරෝගීතාවය පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කළ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකි. උන්වහන්සේ සත්වයාට සදාකාලික මානසික සුවතාව ලබාදීමට මඟ පෙන් වූ ධර්ම දේශනා කළ ශාස්තෘවරයෙකු බව බොහෝ දෙනාගේ පිළිගැනීම යි. සදාකාලික මානසික සුවතාව ලබාගැනීමට යන දුෂ්කර ගමනේ දී කායික සුවතාවයෙන් පසුවිය යුතු බව උන්වහන්සේ අවධාරණය කරති. එබැවින් කායික දුබලතා ඇති පුද්ගලයන් හමු වූ විට ඔවුන්ගේ කායික දුබලතා දුරුකර ගැනීමට අවශ්‍ය උපදේශන හා ප්‍රතිකාර පළමු කොට ලබාදීම උන්වහන්සේගේ චරිතයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්‍ෂණයකි.

වරක් බුදුන්වහන්සේ අනඳ හිමියන් සමඟ විහාර චාරිකාවෙහි හැසිරෙන විට බොහෝ භික්ෂූන්ගේ ශරීර වැහැරුණු රළු ස්වභාව ඇත්තේ දුර්වර්ණව නහර ඉල්පුණු සිරුරු ඇති ව ක්ලාන්ත ස්වභාවයෙන් පසුවන බව දුටුසේක. එයට හේතු කවරේදැයි අනඳ හිමියන්ගෙන් විමසූ කළ ශරත් කාලයෙහි හටගත් පිත්ත රෝගයන්ගෙන් භික්ෂූන් පීඩා විඳින බව සැල කළහ. උන්වහන්සේලා වළඳන ආහාර නොදිරා ම උඩට එන්නේ වෙයි. වමනය වීම හේතුවෙන් දුර්වර්ණවීම දුර්වල වීම ඇති විය. මෙසේ පිත අධික වීම නිසා සාරදිකාබාධයෙන් පෙළුණු භික්ෂූන්ගේ කායික නිරෝගීතාව ඇතිකරලීම සඳහා ගිතෙල්, මී පැණි, වෙඬරු, උක්හකුරු හා තල තෙල් යන පඤ්චභෙසජ්ජය කාලායේත් විකාලයේත් වළඳන්නට අනුදැන වදාළ සේක.[26] මෙම පඤ්චභෙසජ්ජය රළු වූ ආහාරයක් නොවන බවත් සරල ආහාරයක් හා බෙහෙතක් ලෙස බොහෝදෙනා සලකන බවත් දේශනාව තුළ ම පැහැදිලිකර ඇත. මෙම දේශනාව උපයෝගී කොට ගනිමින් ලබුගම ලංකානන්ද නාහිමියෝ මෙසේ පැහැදිලි කරති.

"යමක් බෙහෙත් සඳහා වන්නේ නම් ලෝවැස්සන් අතර බෙහෙත් යයි සම්මත වූයේ නම් ආහාරාර්ථයක් සිදුකරන්නේ නම් ඖදාරික දැඩි වූ ආහාරයකුත් නොවේ නම් එබඳු දැය බෙහෙත් වශයෙන් සම්මතව ඇති බව දැක්වෙන අතර එම බෙහෙත් පඤ්චභෙසජ්ජ නමින් ද සිනිඳු ආහාරයක් ලෙස ද දැක්විය හැකි ය."[27]

බුදුන්වහන්සේ තම ශ්‍රාවකයන්ගේ කායික ශරීර සෞඛ්‍ය පිළිබඳ ව දැඩි අවධානයකින් පසු වූ බව මෙමඟින් පැහැදිලි වේ. පුද්ගලයාගේ ශරීරය දුටු පමණින් යම්කිසි ආබාධයකින් පෙළෙන බව වටහාගෙන එයට සුදුසු ප්‍රතිකර්ම කිරීමට තරම් දක්ෂ වෛද්‍යවරයෙකි.

බුදුන්වහන්සේ අනුදැන වදාළ පඤ්චභෙසජ්ජය වා, පිත්, සෙම්, නසාලීමේ හැකියාව ඇති මහා ඖෂධයක් ලෙස ආයුර්වේදය පිළිගනී. භෙසජ්ජක්ඛන්ධකයේ සඳහන් මෙම රෝගයේ රෝග නිධානය අෂ්ටාංග හෘදය සූත්‍රය සමඟ බෙහෙවින් සමාන බව පෙනේ. අෂ්ටාංග හෘදය සූත්‍රය සාරදිකාබාධය සඳහා ගිතෙල් තිත්ත රසයෙන් යුතු ඖෂධ වර්ග විරේකාදිය ප්‍රතිකාර වශයෙන් යොදාගත යුතු බව දක්වයි.[28]

මෙහි දී පුද්ගලයාගේ මන්දපෝෂණ ස්වභාවය දුරුකරලීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම උන්වහන්සේගේ පරමාර්ථයක් වූ බව සිතිය හැකි ය. මෙලෙසින් ම භික්ෂූන්ට වැළඳුන විවිධ රෝගාබාධ සඳහා කළ ප්‍රතිකාර ද උසස් ඒවා බව පැහැදිලි ය. වරක් බෙල්ලට්ඨිසීස තෙරුන්ට කැසීම්

රෝගයක් (ථුල්ලකච්ඡාබාධය) වැළඳුනේ ය. බුදුන්වහන්සේ මෙම රෝගය පරීක්‍ෂා කොට යම් භික්‍ෂුවකට කැසීමක් හෝ බිබිලි හටගත්තේ ද ඕජස් ගැලීමක් හෝ දැඩි කැසීම් ආබාධයක් හෝ වේද ශරීරය දුගඳ හමා ද එවැනි රෝගීන් සඳහා හුණු බෙහෙත් අනුදනිමියි වදාළහ.[29] බුදුන්වහන්සේ මෙහි දී හුණු වශයෙන් දක්වනුයේ ඖෂධ වර්ගවලින් සකස්කර ගත් හුණුකුඩු විය යුතු ය. විශේෂයෙන් මෙහි දී හුණු බෙහෙත සකස්කර ගැනීමට අවශ්‍ය වංගෙඩිය, මෝල්ගස හා පෙනේරය ද[30] අනුදැන තිබීම තුළින් ඒ බව වඩාත් තහවුරු වේ.

හුණු වර්ග සකසා ගැනීම සඳහා මහරි, කොහොඹ ආදියෙහි හුණු ද ගොම, මැටි හා පඬු බොර යොදා සැකසූ හුණු ද භාවිත කරන්නට ඇත. ආයුර්වේද වෙදකමෙහි ද ඉහත දක්වන ලද ඖෂධ යොදා ගනිමින් හුණු බෙහෙත් සකස් කොටගෙන ඇත. කොහොඹ කොළ, ඇත්තෝර හා පෙති තෝර ද මඳටිය කොළ, ඇට්ටේරිය කොළ හා පොතු යනාදිය කැසීම් රෝග සඳහා භාවිත කළයුතු බව ආයුර්වේද විඥානයේ සඳහන් වේ.[31]

තව ද භික්‍ෂුවක් බලවත් ඇස් රෝගයකින් පීඩා විඳිනුයේ මහත් වූ දුකින් වේදනාවෙන් පෙළුනේ විය. බුදුන්වහන්සේ එම භික්‍ෂුවගේ ඇස් රෝගයේ ස්වභාවය පරීක්‍ෂා කොට අඳුන් ප්‍රධාන කරගත් ඖෂධ නියම කළසේක. භෙසජ්ජක්ඛන්ධකයේ ඇස්රෝග සඳහා නියම කරන ලද අඳුන් නාමිකව මෙසේ පෙන්වා දිය හැකි ය. කාලංජනං (කළු අඳුන්), රසඤ්ජනං (රස අඳුන්), සොතඤ්ජනං (ගං හෝ ආදියෙහි උපදින අඳුන්), ගෙරුකං (සිවන්ගුරු අඳුන්), කපල්ලකං (පහන් සිළු දැලි අඳුන්), චන්දනං (සඳුන්), තගරං (තුවරලා), කාලානුසාරියං (අළු අගිල්), තාලිසං (තලිස්), භද්ද මුත්තකං (වම්මුතු)[32] යනුවෙනි. ඇස ඉතාමත් සියුම් ඉන්ද්‍රියකි. එම සියුම් ඉන්ද්‍රියේ යම්බඳු රෝගයකට ප්‍රතිකාර කරන්නේ නම් කිසිදු විෂ බීජයක් එකතු නොවූ ඉතාමත් පිරිසිදු ප්‍රතිකාරයක් විය යුතු ය. මෙනිසා ම ඇස්රෝග සඳහා සකස්කරගත් අඳුන් ප්‍රධාන ඖෂධ තැන්පත් කොට තබාගැනීම සඳහා පියන සහිත අඳුන් කුලාව ද අනුදත් හ. එසේ ම ඇසේ අඳුන් ගෑමට අඳුන් කූර ද අඳුන් කූර පිරිසිදුව තබා ගැනීමට අඳුන් කොපුවක් ද එය තැනින් තැන ගෙනයාමේ පහසුව සඳහා පටියක් ද අනුදත් හ.[33] මෙම කරුණු සියල්ල ම පිළිබඳ ව විමසීමේ දී බුදුන්වහන්සේ ඇතැම්විට සාමාන්‍ය වෛද්‍යවරයෙකු නොදකින තරම් ඉතාමත් සියුම් ලෙස රෝග සහ එහි ස්වභාවයන් ඒ සඳහා ප්‍රතිකාර කළයුතු ආකාරයත් දැක ඇති බව පෙනේ.

බුදුසමයේ අනුදත් අඤ්ජන වර්ග පෙරදිග වෛද්‍ය විද්‍යාවේ ඇස්රෝග සඳහා භාවිත කළ බව සඳහන් වේ.[34] රසඳුන් පිළිබඳ දීර්ඝ විස්තරයක් ද සිද්ධ ආයුර්වේද නිඝණ්ඩුවේ දක්නට ලැබේ. සිවන් ගුරු අඳුන් ද අක්ෂි රෝග සඳහා සුදුසු ම බව සඳහන් වේ.[35] අක්ෂි රෝග පිළිබඳ ආයුර්වේදයේ දක්වා ඇති ප්‍රතිකාර පිළිබඳ දීර්ඝ විස්තරයක් ලබුගම ලංකානන්ද නාහිමි ත්‍රිපිටකයේ සඳහන් බව භෙසජ්ජසමුච්චය නම් ග්‍රන්ථයේ දී දක්වා ඇත.

පිළින්දවච්ඡ තෙරුන්ට ඇති වූ හිස රුදාවක් සඳහා බුදුන්වහන්සේ අනුදත් ඖෂධ හා ප්‍රතිකාරවිධි ගණනාවක් පිළිබඳ ව සඳහන් වේ. දැඩිවේදනාකාරී ශිර්ෂාබාධ හටගත් කල ඖෂධ මිශ්‍රකොට පිසින ලද තෙලක් හිස ගැල්වීමට අනුදැන වදාළසේක.[36] හිස තෙල් දැමීමෙන් හිස රුදාව සුව නොවන්නේ නම් එකල්හි නශ්‍ය කර්මය කිරීමට අනුදැන වදාළ හ.[37] නශ්‍ය කර්මයෙන් ද හිස රුදාව සුව නොවන කල දුම්පානය කිරීමට ද අනුදත් හ.[38] මෙහි දී බුදුන්වහන්සේ නශ්‍ය කර්මය සඳහා අවශ්‍ය හැන්ද දුම් උරණ පයිප්ප ද අනුදැන වදාරා ඇත.[39] හටගත් හිස රුදාවක් නසාලීම සඳහා පිසගත් තෙල් හිස ගැල්වීම නශ්‍ය කර්මය මෙන් ම ධූමපානය ද යෝග්‍ය බව භෙසජ්ජමඤ්ජුසාවේ සඳහන් කරයි.[40]

පිළින්දවච්ඡ තෙරුන්වහන්සේට හටගත් වාතාබාධයක් සුවපත් කිරීම සඳහා මද්‍යසාරය යොදා තෙලක් පිසගැනීමට අවසර ලබා දී ඇත.[41] තවත් වරෙක එම තෙරුන්ට ම වැළඳුන ඇඟ රුදාවක් හෙවත් අංගවාතරෝගය සඳහා බුදුන්වහන්සේ ස්වේද කර්මය අනුදැන වදාළ සේක. එම රෝගයේ ස්වභාවය අනුව ස්වේද කර්මයේ ප්‍රභේද කිහිපයක් දක්වා ඇත.[42] එම ස්වේද කර්ම සමන්තපාසාදිකාව මෙසේ විස්තර කරයි.[43]

- ස්වේද කම්ම - ඩහදිය ගැන්වීම.
- සම්භාර ස්වේද කම්ම - ඖෂධීය කොළ වර්ග තම්බාගත් හුමාලය ඇඟට අල්ලා ඩහදිය ගැන්වීම.
- මහා ස්වේද කම්ම - පුරුෂ ප්‍රමාණයෙන් (බඹයක් පමණ ගැඹුරු) වලක් කපා එහි ගිනි අඟුරු දමා ඒ මත පස් හා වැලි අතුරා පසුව වාතය නසන කොළ වර්ගවලින් වසා තෙල් ගල්වන ලද රෝගියාගේ සිරුර කොළමත වතුරුවා ඒ මේ අත පෙරලමින් ඩහදිය ගැන්වීම.

- හංගෝදක ස්වේද කම්ම - බෙහෙත් කොටා තම්බා ඒ වතුර ඉසිමින් කොළවලින් තවමින් ඩහදිය ගැන්වීම.
- උදක කොට්ඨක ස්වේද කම්ම - මහ සැළියකට හෝ ඔරුවකට උණුවතුර පුරවා ලෙඩා එහි බැස ඩහදිය ගැන්වීම.

මෙසේ ස්වේදකර්මය අනුදැන වදාළ පිළිවෙළ මඟින් බුදුන්වහන්සේ තුළ වෛද්‍ය කර්මය පිළිබඳ පැවැති විශේෂඥභාවය ප්‍රකට කරයි. ප්‍රතිකාර ක්‍රමය මුල සිට අවසන දක්වා ක්‍රමානුකූල ව බෙහෙත් නියම කරමින් දක්ෂ වෛද්‍යවරයෙකු සේ රෝගය සුවවන තෙක් ප්‍රතිකාර කිරීම මෙහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණය වේ. ආයුර්වේද වෙදකමේ ද ඇඟරුදාව හෙවත් අංගවාතය සඳහා ස්වේදකර්මය කළ බව සඳහන් වේ. ආයුර්වේද වෙදකමේ ස්වේදකර්ම බොහෝමයක් ඇති බව චරකසංහිතාව පෙන්වා දෙයි. සංකරස්වේද, පුස්කරස්වේද, නාඩිස්වේද, හරිසේකස්වේද, අවගාහනස්වේද, ජෙන්තාකස්වේද, අශ්මඝණස්වේද, කර්ෂස්වේද, කුටීස්වේද, භූස්වේද, කුම්භස්වේද, කූපස්වේද, ගෝලෝකස්වේද.[44]

ඉහත දක්වන ලද ස්වේද ක්‍රමවලින් සිදු කෙරෙනුයේ ශරීරයේ ඩහදිය ගැල්වීම තුළින් අංගවාතාදී වාතයන් හරණය කිරීම වේ. එහි දක්වන ලද අවගාහන ස්වේදකර්මය හා කර්ෂස්වේද කර්මය බුදුන්වහන්සේ වදාළ උදකකොට්ඨකස්වේද කර්මයට හා මහාස්වේද කර්මයට සමාන බව පෙනේ. නවීන උපකරණ භාවිතයෙන් බටහිර වෛද්‍ය ක්‍රමය තුළ ද ස්වේදකර්මය සිදු කෙරේ. ඇඟ රුදාව වැනි රෝග සඳහා බටහිර වෙදකම තුළ විදුලි ආලෝකය තුළින් ඇඟ රත්කොට ඩහදිය ගැන්වීමක් සිදු කෙරේ. මේ අනුව බුදුන්වහන්සේ අනුදැන වදාළ ස්වේදකර්ම උසස් ප්‍රතිකාර ක්‍රමයක් ලෙස පෙරපර දෙදිග වෛද්‍ය ක්‍රමවල ද භාවිතයට ගෙන ඇත.

පිළින්දවච්ඡ තෙරුන්වහන්සේට තවත් වරෙක සන්ධි රුදාවක් හෙවත් පුරුක්වාතයක් හටගත්තේ ය. අත්පා ආදී සෑම සන්ධි ස්ථානයක ම දැඩි වේදනාවක් ඇති විය. බුදුන්වහන්සේ මෙම රෝගය සඳහා ලෝහිත මෝචනය හෙවත් ලේ ඇරීම කළ යුතු යයි දක්වා එය සිදු කිරීමට අඟක් ද අනුදැන වදාළ හ.[45] ශරීරයේ දූෂිත වූ රුධිරය මුදා හැරීම සුදුසු බව පෙරදිග වෛද්‍ය ක්‍රමයේ ද සඳහන් වේ. වාතයෙන්, පිතෙන් හා සෙමෙන් දූෂිත වූ රුධිරය බැහැරකිරීම සඳහා වෙන වෙන ම උපකරණ භාවිතයක් ගැන ආයුර්වේද ව්‍යාකරණ නම් ග්‍රන්ථයේ විස්තර කෙරේ. ඒ අනුව වාතයෙන්

දූෂිත වූ රුධිරය මුදාහැරීම සඳහා අඟක් භාවිත කිරීම සුදුසු බව එහි මෙසේ දක්වයි.

"ගව අඟ උණුසුම් ය. මිහිරි සහිත ය. සිනිඳුයයි ද කියන ලදී, එහෙයින් වාතයෙන් දූෂිත වූ ලේ ඇති කල්හි ඒ ගව අඟ ලේ හැරීමෙහි හිත වේ."[46]

බුදුන්වහන්සේගේ අනුදැනීම හා පෙරදිග වෛද්‍ය ක්‍රමය පිළිගත් ප්‍රතිකාර විධි යම් යම් සමානකම්වලින් ද යුක්ත බව පෙනේ. බුදුන්වහන්සේ ද වාතයෙන් දූෂිත වූ ලේ මුදා හැරීම සඳහා අනුදැන වදාළේ අඟක් භාවිත කිරීමට ය. මෙය කායික විශේෂඥ වෛද්‍යවරයෙකු වශයෙන් උන්වහන්සේ තුළ තිබූ තීක්ෂණ කල්පනාව ප්‍රකට කරන කදිම අවස්ථාවකි.

පාද පැළීම නිසා මහත් වේදනාවෙන් පසු වූ පිළින්දවච්ඡ තෙරුන්ට එම ස්ථානවල තෙල් ගල්වන ලෙස නියම කර ඇත. තෙල් ගැල්වීමෙන් සුවපත් නොවන්නේ නම් පයට හිත වූ බෙහෙතක් පිළියෙල කරන්නට ද අනුදැන වදාළ සේක.[47] එදවස පමණක් නොව අද ද ඉන්දීය සමාජයේ තල තෙල් ගා පාද පමණක් නොව මුළු ශරීරය ම සම්භාහනය කිරීමේ ලක්ෂණය දැකිය හැකි ය. එය බොහෝ රෝග සමනය කිරීම සඳහා හේතුවන බව ද පිළිගනිති. කෙසේ වෙතත් බුදුන්වහන්සේ පාද පැළීමේ රෝගය සඳහා සුදුසු බෙහෙතක් පිසගන්නට යැයි කළ ප්‍රකාශය සමන්තපාසාදිකාවෙහි විස්තර කරන්නේ එය පොල් ආදී ඖෂධ මිශ්‍රකර ගනිමින් සකස්කර ගන්නා බෙහෙතක් බවයි.[48]

එක්තරා භික්ෂුවක් ශරීරයේ හටගත් ගෙඩියක් (ගණ්ඩාබාධ) හේතුකොට ගෙන බලවත් වේදනාවකට පත්විය. බුදුන්වහන්සේ එම රෝගී භික්ෂුව පරීක්ෂා කොට ශල්‍ය කර්මය නියම කළ හ. ශල්‍යකර්මයෙන් පසුව තුවාලය සේදීම සඳහා කසට වතුර, තුවාලයෙහි ආලේප කිරීම සඳහා කල්කය, තුවාලයෙහි ආරක්ෂාව සඳහා පැලැස්තරය ද වෙළුම් පටි ද නියම කළහ. තුවාලයේ කැසීම් ඇතිවන්නේ නම් තුවාලය වට අබ කුඩු ඉසීම ද ඕජස් වැගිරෙන්නේ නම් දුම් ඇල්ලීම ද නියම කළහ.[49] එසේ ම තුවාලයේ අවශ්‍ය ප්‍රමාණයට වඩා මස් දළු ලියලා ඇත්නම් ලුණු පුපුරකින් ඒවා කපා දැමීමටත් මස් වැඩී තුවාලය ගොඩ නොවන්නේ නම් තුවාල තෙල් වර්ග ගැල්වීමට ද නියම කළහ. තුවාල තෙල් වැගිරීම වළක්වාලීම සඳහා රෙදි කඩක් යොදන ලෙස ද දක්වා ඇත. මේ හැර සියළු වණ පිළියම් ක්‍රම භාවිත කිරීමට ද බුදුන්වහන්සේ අනුමැතිය දී ඇත.[50]

මෙහි දී බුදුන්වහන්සේ ගෙඩිය පැලීම සඳහා ශල්‍යකර්ම නියම කොට අනතුරුව එම තුවාලය සුව වන තෙක් ක්‍රමානුකූල ප්‍රතිකාර පද්ධතියක් නියම කොට ඇත. පෙරදිග වෛද්‍ය ශාස්ත්‍රය තුළ ද මෙවැනි ශල්‍යකර්ම භාවිත කරන බව වෛද්‍ය ඩී.සී. ජයසේකර මහතා ආයුර්වේද ඖෂධාවලී නම් ග්‍රන්ථයෙහි සඳහන්කර තිබේ. එසේ ම බුද්ධකාලයේ ද පෙරදිග වෛද්‍ය ක්‍රමය අනුගමනය කළ ජීවක වෛද්‍යාචාර්යතුමා සිදුකළ ශල්‍යකර්ම පිළිබඳ විනය පොතේ සඳහන් වේ.[51] ශල්‍ය වෛද්‍ය ක්‍රමය ඉතාමත් බහුල වශයෙන් භාවිතා කරනුයේ බටහිර වෛද්‍ය ක්‍රමය තුළ ය. තාක්‍ෂණයෙන් නොදියුණු සමාජ පසුබිමක් පැවතියේ යැයි සම්මත බුද්ධකාලීන සමාජයේ ශල්‍යකර්ම මඟින් රෝග සුව කිරීමට කටයුතු කිරීම පුදුම සහගත දෙයක් ලෙස දැක්විය හැකි ය. අද බටහිර වෙදකම තුළ වණ පිළිකා ආදී රෝග මෙන් ම ශරීර අභ්‍යන්තරයේ පවත්නා විවිධ රෝග ශල්‍යකර්ම මඟින් බොහෝ විට සුවපත් කරන බව පෙනේ. දියුණු ක්‍රමවේදයක් ඇති වර්තමාන බටහිර වෙදකමේ දී ශල්‍යකර්ම සඳහා අනුගමනය කරන ප්‍රතිකාර විධි සියල්ල බුදුරදුන් ද අනුගමනය කර ඇති බව පැහැදිලි ය. භාවිත කළ සහ කරන ඖෂධ වර්ග වෙනස් වුව ද ප්‍රතිකාරවල වෙනසක් නොමැති බව පෙනේ.

වරක් සර්පයකු දෂ්ට කළ භික්‍ෂුවක් සඳහා මළමූත්‍රා, උණුඅළු හා මැටි යන සතර මහාවිකටය දීමට නියම කළහ.[52] මෙම ඖෂධ සංයෝගයෙන් සර්ප විෂ නසාලීමේ ශක්තියක් පවතීදැයි විද්‍යාත්මක පර්යේෂණයක් කළ යුතුව ඇත. කෙසේ නමුත් සර්ප විෂ නසාලීම සඳහා ගැමි සමාජයේ මෙන් ම පෙරදිග වෛද්‍ය ක්‍රමයේ ද ඖෂධ සංයෝග අතරට මුත්‍රා එකතුකර ගැනීම සුළභ කරුණකි. තවත් වරක විෂ පානය කරන ලද භික්‍ෂුවකට අසූචි පානය කරවන්නට නියම කළහ.[53] විශේෂයෙන් මෙය විෂ නසාලන ඖෂධයක් නොවනු ඇත. විෂ පානය කළ පුද්ගලයකුට අසූචි පෙවීම නිසා පිළිකුල හේතුකොට ගෙන වමනය කරවීමෙන් සුවය ලබාදීම මෙහි අපේක්‍ෂාව වූවා විය හැකි ය. වර්තමාන සමාජය තුළ ද විෂ පානය කළ පුද්ගලයන් මෙවැනි උපක්‍රම තුළින් වමනය කරවා සුවපත් කරනු දැකිය හැකි ය. තව ද වශීකරන බෙහෙතක් පානය කරන ලද භික්‍ෂුවකට සරදින්නකාබාධය වැළඳුනේ ය. එහිදී බුදුන්වහන්සේ ඖෂධ වශයෙන් හී විට (නඟුලෙහි ඇළුණු මඩ දියෙහි කලතා) පොවන්නට නියම කර ඇත.[54] මෙවැනි ප්‍රතිකාරවල පවත්නා ඖෂධ ගුණය කවරේදැයි සොයාබැලීම කාලෝචිත ය.

ග්‍රහණී රෝගයෙන් පීඩා විඳි භික්‍ෂුවක් සඳහා ආමිෂක සාරය පොවන්නට බුදුන්වහන්සේ අනුදැන වදාළ සේක.[55] ආමිෂක සාරය පිළිබඳ ව සමන්තපාසාදිකාව විස්තර කරන්නේ වියලි බත් පුළුස්සා කුඩුකර වතුරේ

දියකර පෙරාගත් ලෙස ය.[56] වියලි බත් පුළුස්සා කුඩුකර වතුරේ දියකර පෙරාගත් පසුව එය කෂාය වර්ණයෙන් යුක්ත ය. එසේ පෙරාගත් ආමිෂ සාරය ග්‍රාහණි රෝගයට ප්‍රත්‍යක්ෂ ඖෂධයක් ලෙස ලබුගම ලංකානන්ද හිමියන් ද දක්වා ඇත.[57]

පාණ්ඩු රෝගයෙන් පෙළුණු භික්ෂුවකට ඖෂධ වශයෙන් මුක්ත හරිටකය පොවන්නට බුදුරජාණන්වහන්සේ අනුදැන වදාළ හ.[58] පාණ්ඩු රෝගය සඳහා මුක්තහරිටකය ප්‍රතිකර්මයක් වශයෙන් සුදුසු බව මහා ධම්මසමාදාන සූත්‍රයෙහි දී දැක්වේ.[59] මුක්තහරිටකය යනු ගව මූත්‍රයෙහි අරළු දමා සකස්කර ගන්නා ඖෂධයක් බව සමන්තපාසාදිකාව සඳහන් කරයි.[60] බෞද්ධ වෙදකමේ ඉතාමත් ම ජනප්‍රිය මෙන් ම බොහෝ රෝගාබාධ සමනය කරන ඖෂධයක් ලෙස මුක්තහරිටකය හෙවත් පූතිමුක්ත භෙසජ්ජය හඳුන්වා දිය හැකි ය. සැළියකට නිරෝගී එළදෙනකගේ මුත්‍රාගෙන එයට අරළු දමා සැළියේ කට වසා මැටි බැඳ තෙමසකට නොඅඩු තෙවසරකට නොවැඩි කාලයක් තබා පෙරාගන්නා ඖෂධය මුක්තහරිටකය ලෙස ගැනේ. මෙම ඖෂධය අද ද ඇතැම් භික්ෂූන් මෙන් ම පෙරදිග වෛද්‍යවරු භාවිත කරති. මෙම ඖෂධය තුළ පාණ්ඩු රෝගය ආදී කොට ගෙන ඇති රෝග රැසක් නසාලීමේ ශක්තිය පවතින බවත් කියවේ. පෙරදිග වෙදකමේ අරළු සහ ගෝ මුත්‍ර රෝග නසාලීමේ ශක්තිය ඇති බවත් ශරීර ශක්තිය වැඩි දියුණු කොට නිරෝගී බව ආරක්ෂා කරලීමේ ශක්තිය පවතින උසස් ඖෂධ ලෙස හඳුන්වා දී ඇත.

ඡවිදෝෂාබාධ හෙවත් හමේ හටගන්නා රෝග සඳහා සුවඳ ද්‍රව්‍ය ගැල්වීම ට බුදුන්වහන්සේ අනුදැන වදාළ හ.[61] සමේ රෝග හටගැනීම සඳහා සමේ අපිරිසිදු බව මූලික වශයෙන් හේතු වේ. එසේ ම සමේ රෝග හටගත් විට දුගඳ හැමීම ද සිදු වේ. එබැවින් සම පිරිසිදු කොට සුවඳ ඖෂධ වර්ග ගැල්වීම එයට ප්‍රතිකාර වේ. පෙරදිග වෛද්‍ය ක්‍රමයේ දී චර්ම රෝග සඳහා සුවඳ ද්‍රව්‍ය ආලේප කිරීම සිදු කරන බව භෙසජ්ජමඤ්ජුසාව සඳහන් කරයි.[62] වර්තමානයේ ද බොහෝ වශයෙන් කාන්තාවන් තම මුහුණේ හටගත් කුරුලෑ ආදී චර්ම රෝග සුවකර ගැනීම සඳහා විවිධ සුවඳ ද්‍රව්‍ය එකතු කරගත් ආලේපයන් ඇඟ ගානු ලැබේ. සුදුහඳුන් මිශ්‍රිත ආලේප බොහෝ සෙයින් භාවිත කෙරේ.

දොස් කිපුණු භික්ෂුවක් සඳහා බුදුරජාණන්වහන්සේ විරේචනයක් පානය කරන්නට අනුදැන වදාළ සේක. විරේචනයෙන් පසු ව කැඳ වතුරත්, මුං ඇට වතුරත්, මස් රසයෙන් ප්‍රයෝජනවත් වේ නම් එයත් අනුදැන වදාළ

හ.[63] වර්තමාන පෙරදිග වෛද්‍ය ක්‍රමයේ වුව ද දොස් කිපීමේ රෝග සඳහා විරේචනය නියම කරන අතර විරේචනයෙන් පසු ව කැඳ වතුර නියම කිරීම අනිවාර්ය වූවකි. ඇතැම් විට මුං ඇට වතුර ද නියම කෙරේ. විරේක බෙහෙත් නියම කිරීම හා ඉන් පසුව රෝගියා පාවිච්චි කළ යුතු ආහාර පානාදිය නියම කළ ආකාරය ලෙස බලන කල බුදුන්වහන්සේ ඒ පිළිබඳව මනා අවබෝධයකින් යුතුව දක්ෂ වෛද්‍යවරයෙකු සේ සිදුකර ඇති බව පෙනේ. බෞද්ධ වෙදකමේ දක්වන ඖෂධ අතර ලෝණසෝවීරක ඖෂධයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. භික්ෂුවක් උදරාබාධයක් වැළඳී පීඩා විඳින්නේ ලෝණසෝවීරක භෙසජ්ජය වැළඳුවේ ය. එම ප්‍රතිකාරයෙන් ම රෝගය සුව විය. භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළ කල්හි උන්වහන්සේ ද උදරාබාධය සඳහා ලෝණසෝවීරකය අනුදැන වදාළ සේක. නොගිලන් අයට ද දිය හා මුසුකර පානය කිරීමට නියම කළ හ.[64]

ලෝණසෝවීරක ඖෂධය සකස්කර ගන්නා විධිය ගන්නා ද්‍රව්‍යයන් හා එම ඖෂධය පරිභෝග කිරීමෙන් සුවකර ගතහැකි රෝග ආදිය පිළිබඳව සමන්තපාසාදිකාව දීර්ඝ විස්තරයක් සපයයි. මෙය සකස්කර ගැනීම සඳහා අරළු, බුළු, නෙල්ලි ද ගොඩ ගොවිතැනෙන් ලබාගන්නා මුං ඇට ආදී සියළු ධාන්‍යය ද සාලි, වීහී, කුදැස, ගෝධුම, වරක, යව, කඩගු යන සප්ත ධාන්‍යයන්ගෙන් පිළියල කරගත් බත් ද කෙසෙල් ආදී සියලු පළතුරු ද වැටකේ, හිද ආදී සියලු ගොබද, මත්ස්‍ය, මාංස කැබලි ද නොයෙක් මිදි, මී පැණි, සහිද ලුණු, කුළු බඩු ආදී බෙහෙත් ද්‍රව්‍ය බහා සැලිය ජලයෙන් පුරවා කට වසා මැටි බැඳ අවුරුදු එකක් දෙකක් හෝ තුනක් තබා පෙරා ගත යුතු ය. හොඳට පැසුණු කල ජම්බු යුෂ වර්ණ වේ.[65] මෙම භෙසජ්ජය සකසා ගැනීම සඳහා දිගුකලක් ගතවන බවත් බොහෝ ඖෂධ යොදාගන්නා බවත් අටුවාව පැහැදිලි කරයි.

මෙම භෙසජ්ජය පරිභෝග කිරීමෙන් වාත, කුෂ්ට, පාණ්ඩු, භගන්දරා ආදී රෝග සුව වන බවත් ආහාරයෙන් පසු ගැනීමට මෙතරම් හොඳ ආහාර දිරවන බෙහෙතක් නොමැති බවත් සඳහන් වේ. නොගිලන් භික්ෂූන් බත්හි පානය කළ යුත්තේ දිය මිශ්‍ර කොට බවත් සඳහන් කරයි.[66] මෙම ලෝණසෝවීරක භෙසජ්ජය බොහෝ රෝග සඳහා ප්‍රත්‍යක්ෂ ඖෂධයක් බව විනය අටුවාව දක්වන බැවින් මෙහි පවත්නා ඖෂධීය ගුණය පිළිබඳ ව විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කරන්නේ නම් එය බොහෝ දෙනාගේ යහපත පිණිස උපයෝගී කරගත හැකි ය.

තෙකටුල යාගු හෙවත් තිකුළු කැඳ උදරවාතාබාදයට ප්‍රත්‍යක්ෂ ඖෂධයකි. වරක් බුදුන්වහන්සේ උදරවාතාබාධයෙන් පෙළුනෙ වේ. එම අවස්ථාවේ දී ආනන්ද හිමියන් භාග්‍යවතුන්වහන්සේට මීට පෙර ද උදරවාතාබාධය වැළඳුන විට තිකුළු කැඳ වැළඳීමෙන් සුවය ලැබුනේයැයි සිතා තිකුළු කැඳ සකසා පිළිගැන්වූ හ.[67] මහාවග්ග පාලියේ එන විස්තරය අනුව උදරවාතාබාධය සඳහා තිකුළු කැඳ (තල, සහල්, මුං යොදා සැකසූ කැඳ) භාවිත කළ බව කියවේ. මේ පිළිබඳ ව සමන්තපාසාදිකාවේ මෙසේ සඳහන් වේ. තල, සහල්, මුං හෝ තල, සහල්, මෑ හෝ තල, සහල්, කොල්ලු වශයෙන් තල, සහල් සමඟ අපරන්නයක් (හේන් ධාන්‍යයක්) යොදා එයට හතරෙන් පංගුවක් වතුර මිශ්‍රකර කිරි, ගිතෙල්, මී, හකුරු ආදිය යොදා පිසගත් කැඳ කිතුළු කැඳ ලෙස දක්වයි.[68] මෙසේ උදර රෝග සඳහා බෙහෙත් සකස් කිරීමේ දී සහල්, මුං, එළකිරි ආදී ඖෂධ යොදාගෙන ඇති බව භෛසජ්ජමඤ්ජුසාවේ සඳහන් වේ.[69] මේ අනුව තල, සහල්, මුං ආදී ඖෂධ යොදා ගනිමින් උදර වාතාබාධය සඳහා පෙරදිග වෙදකමේ ද ප්‍රතිකාර කරන බව පෙනේ.

භික්ෂූන්වහන්සේ නමකට භගන්දරා රෝගය වැළඳි අවස්ථාවක අකාසගොත්ත නම් වෛද්‍යවරයා ශල්‍යකර්මයක් කළ බවත් එම සැත්කමෙන් ඇතිවූ ව්‍රණය සුවකරගැනීමේ අපහසුතාවක් ද පැවති බව මහාවග්ග පාලියේ සඳහන් වේ. මේ පිළිබඳ සියළු තොරතුරු පරීක්‍ෂා කොට බුදුන්වහන්සේ ලිංග ආශ්‍රිත ප්‍රදේශයේ ශල්‍යකර්මය සිදුකිරීම තහනම් කළ සේක.[70] භගන්දරා රෝගාබාධය පිළිබඳ විස්තර පෙරදිග වෛද්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථවල ද දැක් වේ. ඒවායේ පැහැදිලි කරන පරිදි භගන්දරා රෝගය යනු මහා රෝග වශයෙන් දක්වන රෝග අටෙන් එකකි. භෛසජ්ජමඤ්ජුසාවෙහි භගන්දරා රෝගය වැළඳීමට හේතු මෙන් ම ඒවායෙහි ප්‍රභේද ද දක්වන අතර කළ යුතු ඖෂධ ද දක්වා තිබේ.[71] මෙයට ප්‍රතිකාර ලෙස ශල්‍යකර්ම කළ යුතුයැයි එහි නොකිය වේ. එහෙත් මෙම රෝගය සඳහා ශල්‍යකර්මය එක් ප්‍රතිකාර විධියක් ලෙස පෙරදිග වෛද්‍ය ක්‍රමය පිළිගෙන ඇති බව චරක සංහිතාව පැහැදිලි කරයි. එසේ ම ශල්‍යකර්මය නොකොට වුව ද මෙම රෝගය සුවකළ හැකි බව දැක් වේ. මේ නිසා භික්ෂූන්ට මෙම රෝගය වැළඳි විට ශල්‍යකර්මය නොකොට සුවකර ගැනීමට බුදුන්වහන්සේ උපදෙස් ලබා දී ඇති බව පෙනේ. කෙසේ නමුත් නොපමාව මේ සඳහා පිළියම් කළ යුතු බව අවධාරණය කෙරේ. නොපමාව පිළියම් නොකළහොත් භගස්ථාන, වස්තිස්ථාන, ගුදස්ථාන යන මෙතැන් පැලෙයි. ඒ කියන ස්ථාන පැලෙන්නටවත් කල්හි අධොගත වතය ද මුත්‍ර ද මළ ද ශුක්‍ර ද යන මෙකී දෙය පැලුණාවූ සිදුරුවලින් පිටත නික්මෙන්නේ ය.[72]

තාක්ෂණික උපකරණ හා ශිල්පීය ක්‍රම ඉහළ මට්ටමක නොතිබීම හේතුවෙන් භගන්දරාව වැනි රෝග සඳහා ශල්‍යකර්ම නොකළ යුතුයැයි නියම කරන්නට ඇතැයි සිතිය හැකි ය. ලිඟු ප්‍රදේශයේ සම ඉතා සිනිඳු බැවින් ද නිතර එහි තෙතමනය රඳා සිටින හෙයින් ද වණ සුව කරගැනීමේ අපහසුව දැඩිව පවතින බැවින් ද එදා තිබූ සමාජ තත්ත්වය මත එම ප්‍රදේශයේ ශල්‍යකර්ම කිරීම තහනම් කොට තිබීම පුද්ගලයාගේ ජීවිත ආරක්ෂාවට හේතු වූවා විය හැකි ය. වර්තමාන බටහිර වෛද්‍ය ක්‍රමයේ භගන්දරා, අර්ශස්, හර්නියා, අණ්ඩවාතය, ඇතැම් උදරාබාධ වැනි රෝග සඳහා බොහෝ වශයෙන් ශල්‍යකර්ම සිදු කරයි.[73] මේ අනුව බලන විට ලිංග ප්‍රදේශයේ හෝ හාත්පස ශල්‍යකර්ම කිරීම තහනම් කිරීමේ ප්‍රඥප්තිය වත්මන් වෛද්‍ය ක්‍රම අනුව සංශෝධනය කළ යුතු බව පෙනේ. බුදුරජාණන්වහන්සේ බුද්ධශ්‍රාවකයන්ට වැළඳුන කායික රෝග සඳහා ඉහත සඳහන් කළ පරිදි එකී රෝගවලට අදාළ ව ඖෂධ නියම කොට ඇති බව පැහැදිලි ය.

කායික රෝග වැළඳීමට හේතුකාරක ධර්ම අතරට මානසික සුවතාව නොතිබීම ද හේතු වේ. එසේ ම කායික රෝගී තත්ත්වයන් වැඩිවීම සඳහා ද මානසික සුවතාව නොතිබීමත් කායික රෝග සුව වීම සඳහා මානසික සුවතාව පවත්වා ගැනීමත් හේතු වේ. මෙම තත්ත්වය බුදුන්වහන්සේ ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයෙකු වශයෙන් අවබෝධ කරගෙන කටයුතු කළ බව පෙනේ. ඇතැම් භික්ෂූන් කායිකව රෝගීව පීඩා විඳි විට බුදුන්වහන්සේ විසින් දහම් දේශනා කරනු ලැබීමෙන් සිත් පහන් වී එම රෝගී තත්ත්වයෙන් සුවපත් වූ බව බොජ්ඣංග සූත්‍ර ධර්මවලින් පැවසේ.

පිප්ඵලී ගුහාවෙහි වැඩ සිටි මහා කාශ්‍යප මහරහතන් වහන්සේ රෝගීව ඉවසිය නොහැකි දැඩි වේදනාවෙන් පසු වූයේ වෙයි. අනතුරුව බුදුන්වහන්සේ සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන සත්ත බොජ්ඣංග ධර්ම මුල් කොටගත් සූත්‍ර දේශනාව කළසේක. එය ශ්‍රවණය කිරීමෙන් හටගත් චිත්තප්‍රීතිය නිසා සියළු වේදනාවන් දුරුව නිරෝගීව නැගී සිටි බව සඳහන් වේ.[74]

බුදුන්වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි මහත් රෝගී තත්ත්වයට පත් වූ මහ මුගලන් තෙරුන්වහන්සේ ගිජුකුළු පව්වෙහි වැඩවසති. එහිදී ද බුදුන්වහන්සේ සත්තබොජ්ඣංග ධර්ම මුල් කොටගෙන සිදු කළ දේශනාව පිළිගෙන සතුටු සිත් ඇතිව සියලු රෝග පහව නිරෝගීව නැගී සිටි බව සඳහන් වේ.[75]

තව ද බුදුන්වහන්සේ රෝගීව වේළුවනාරාමයෙහි වැඩ වසන කල චුන්ද තෙරුන් බුදුන්වහන්සේ වෙත පැමිණ සත්ත බොජ්ඣංග ධම් සිහිගන්වමින් කළ දේශනාව පිළිගැනීමෙන් සතුටුව රෝගීබවින් නැගී සිටි බව තතිය ගිලාන සූත්‍රය සඳහන් කරයි.[76]

මෙසේ බුදුන්වහන්සේ තම ශ්‍රාවකයන් ගිලන් වූ විට ධම්ය සිහිගැන්වීම තුළින් සුවය ලබාදීමට කටයුතු කළසේක. බුදුන්වහන්සේ රෝගී වූ විට ද ධම්ය සිහිගැන්වීම නිසාවෙන් හටගත් ප්‍රීතිය හේතුකොට ගෙන කායික රෝගී බවින් නැගී සිටි බව කිය වේ. මේ අනුව උන්වහන්සේ සත්වයාට වැළදෙන කායික රෝග සුව කිරීමේ ඖෂධයක් ලෙස ධම්ය ද යොදාගෙන ඇති බව පෙනේ. බුදුන්වහන්සේ මෙසේ කායික රෝග සඳහා දහම් ඖෂධයෙන් ප්‍රතිකාර කිරීම පිළිගත් බෞද්ධ ජනයා අද ද කායික මානසික දෙයාකාර රෝග වුපසමනය සඳහා කරන ප්‍රතිකාර අතරට ධම්ය දේශනා කරවා ගැනීම මෙන්ම පිරිත් දේශනා කරවා ගැනීම ද සිදුකරයි. එපමණක් ද නොව බුදුන් වහන්සේ කායික රෝගී බවින් පෙළුණු භික්ෂූන්ට පරිභෝගය සඳහා අවශ්‍ය සිවුරු පිරිකර ආදිය පිළිබඳව පරිභෝග කළයුතු ආහාර පාන පිළිබඳව, කළ යුතු කායික ව්‍යායාම ආදී බොහෝ දේ පිළිබඳව කරන ලද පැහැදිලි කිරීම් ඛන්ධක විනය තුළ දැකගත හැකි ය.

බුදුසමයේ භික්ෂූන්ට පරිභෝග කළ හැකි සහ පරිභෝග නොකළ යුතු මාංස පිළිබඳව සඳහන් වේ. ඇතැම් විට ඖෂධ සඳහා ද මාංස පරිභෝගයට ගෙන ඇති බව පෙළ දහමෙහි සඳහන් වේ. වරක් භික්ෂූන්වහන්සේ නමකට අමනුෂ්‍යාබාධයක් හටගත්තේ වේ. මෙම භික්ෂුව සුවපත් කිරීම සඳහා ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලා විවිධ ප්‍රතිකාර කළ නමුත් රෝගය සුව නොවී ය. පසුව එම භික්ෂුව ඌරන් මරණ තැනකට ගොස් අමුමස් කා ලේ බීවේ ය. එයින් ම අමනුෂ්‍යාබාධය සුව විය. බුදුන්වහන්සේට මෙය සැල කළ කල්හී අමනුෂ්‍යාබාධය සඳහා අමු මස් හා අමු ලේ අනුදැන වදාළ හ.[77] එසේ වුවත් රෝගී බවින් පෙළෙන අවස්ථාවක දී වුව එයින් මිදීම සඳහා ඖෂධ වශයෙන් වත් මිනී මස් ආදී කොට ඇති මස් වර්ග රැසක් පරිභෝග කිරීම බුදුන්වහන්සේ තහනම් කළ සේක. භික්ෂූන්ගේ ආරෝග්‍යතාවය හා ආරක්ෂාව පිළිබඳව සැලකිළිමත් වූ බුදුන්වහන්සේ භික්ෂූන්වහන්සේලාට ඇත් මස්, අශ්ව මස්, බලු මස්, සර්ප මස්, සිංහ මස්, ව්‍යාඝ්‍ර මස්, දිවි මස්, වලස් මස්, කරබානා වලස් මස් තහනම් කළ හ.[78] බුදුන්වහන්සේ භික්ෂූන්වහන්සේට ඉහත සඳහන් මස්වර්ග වලට අයත් නොවන ත්‍රිකෝටි පාරිශුද්ධ මාංශය වැළඳීමට අනුදත් හ. ත්‍රිකෝටි පාරිශුද්ධ

යනුවෙන් අර්ථ දැක්වෙනුයේ භික්ෂූන් වෙනුවෙන් පිළියෙල කරන ලද මාංශයක් බව නොදැක්ක, නොඇසූ හා සැක නොකරන මාංශයක් විය යුතු බවයි.[79]

බුදුන්වහන්සේ පරිභෝගයට සුදුසු ආහාර වශයෙන් පිසූ හා නොපිසූ පලාවර්ග, පිටි කෑමවර්ග අනුදැන වදාළ සේක.[80] එසේ ම පළතුරු පරිභෝගය ද අනුදැන වදාළ සේක.[81] වර්තමානයේ පෙර අපර දෙදිග වෛද්‍ය විද්‍යාවට අනුව සත්වයාගේ නිරෝගීතාවට බොහෝසෙයින් පලාවර්ග සහ පළතුරුවර්ග ආහාරයට ගැනීමට උපදෙස් දෙයි. විශේෂයෙන් බුදුන්වහන්සේ භික්ෂූන්වහන්සේලා සඳහා පළතුරුවලින් සකස් කරගන්නා අෂ්ටපානය කාලයෙහිත් විකාලයෙත් වළඳන්නට අනුදැන වදාළ හ.[82] පුද්ගල නිරෝගීතාව සඳහා කැඳ පරිභෝගය හේතුවන බව අර්ථවත් කරමින් කැඳෙහි ආනිසංස දහයක් වදාළ සේක.[83]

බුදුන්වහන්සේ කායික රෝග සඳහා වූ ඖෂධ හා ප්‍රතිකාර නියම කළා සේ ම නිරෝගීතාව රැකගැනීම සඳහා ආහාර ද නියම කොට ඇති බව පැහැදිලිය. උපන් සත්වයාට යැපීමට ප්‍රමාණවත් ආහාර නොවීම ලොකුම රෝගය හැටියට බුදුසමය පිළිගනී. එසේ ම බුදුන්වහන්සේ දක්වන්නේ ප්‍රමාණයට වඩා ආහාර ගැනීම ද රෝගී බවේ ලක්ෂණයක් වන බවයි. බුදුන්වහන්සේ නියම කළ ආහාර පරිභෝගයේ දී පමණ දැනගෙන ගත යුතු බවත් ආහාර පරිභෝග කරන්නේ කුමක් සඳහා දැයි සිහිකටයුතු බවත් පැහැදිලි කරයි.[84]

පුද්ගලයාගේ නිරෝගීභාවය ආරක්ෂාකර ගැනීම සඳහා කායික ව්‍යායාමය ද තිබිය යුතු ය. ඒ සඳහා ගිහියනට විවිධ ක්‍රීඩා කටයුතු කළ හැකි ය. එහෙත් ඉන්ද්‍රිය සංවරය ඇතිකරගත් භික්ෂූන්ට කායික ව්‍යායාම සඳහා ක්‍රීඩා කිරීම වැනි ක්‍රියා අනුමත කළ නොහැකි ය. එනිසා ම බුදුන්වහන්සේ භික්ෂූන්වහන්සේට කායික ව්‍යායාමය සඳහා සක්මන් කිරීම අනුමත කළ සේක. සක්මන් කිරීමේ අනුසස් ද මෙසේ පෙන්වා දෙති.

- දුර ගමන් යාමේ පහසුව ඇති කරයි.
- යෝග භාවනාව පහසු කරයි.
- ශරීරයේ ලෙඩදුක් අඩු කරයි.
- වැළඳූ ආහාර හොඳින් ජීර්ණය කරයි.
- සමාධිය චිරස්ථායී වේ.[85]

ඉහත සාකච්ඡා කරන ලද සාධක අනුව බුදුන්වහන්සේ කායික රෝග සඳහා ඖෂධ නියම කරමින් ප්‍රතිකාර කළ බව පැහැදිලි ය. එසේ ම කායික සුවතාව සඳහා ආහාරපාන නියම කළා සේම ශරීර ව්‍යායාමයෙහි අවශ්‍යතාව ද මැනවින් පෙන්වා දුන් සේක. මෙයින් සියළු කරුණු සැලකීමේ දී බුදුන්වහන්සේ කායික රෝග පිළිබඳ මෙන් ම පුද්ගල සුවතාව පිළිබඳ මනා අවධිකමකින් පසු වූ විශේෂඥ වෛද්‍යවරයෙකු බව පෙනේ.

## පාදක සටහන්

1. අං.නි. 2, රෝගසූත්‍රය, 276 පිටුව, බු.ජ.ත්‍රි.
2. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 524 පිටුව, බු.ජ.ත්‍රි.
3. සමන්තපාසාදිකාව, පේමරතන හිමි වැලිවිටියේ, (සංස්), 518 පිටුව, 1945
4. -එම-
5. අෂ්ටාංග හෘදය සූත්‍ර අධ්‍යාය 16
6. වෙත්තමුණි විජයසිරි, මහාවංශය හා සිංහල ජන ජීවිතය, 149 පිටුව
7. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 524 පිටුව, බු.ජ.ත්‍රි.
8. -එම-
9. සිංහල කෂාය ප්‍රකරණය 1-2 පිටු, 1958
10. -එම-
11. චක්‍රදත්ත වාතරක්ත චිකිත්සා, 169 පිටුව
12. -එම- 45 පිටුව
13. සිංහල කෂාය ප්‍රකරණය 19 පිටුව, 1958
14. සුශ්‍රැත සූත්‍ර 38 අධ්‍යාය, 162 පිටුව
15. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 526 පිටුව, බු.ජ.ත්‍රි.
16. සුශ්‍රැත සූත්‍ර 38 අධ්‍යාය, 166 පිටුව
17. -එම-
18. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 526 පිටුව, බු.ජ.ත්‍රි.
19. ඤාණවිමල හිමි කිරිඇල්ලේ, දේශීය වෛද්‍ය ශබ්දකෝෂය, 317-318 පිටු
20. ශාලි ග්‍රාම නිඝණ්ඩු, හරිතක්‍යාදී වර්ගය
21. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 526 පිටුව, බු.ජ.ත්‍රි.
22. සමුද්‍රලවණං හෘද්‍යං - රුච්‍යං ස්නිග්ධං ච දීපනම්
    ක්ෂාරං භෙදි වාතඝ්නං - නාත්‍යුෂ්ණං නාතිශීතලම්
    රසතරංගනී - චතුර්දස තරංගනී

23. -එම-
24. කුලතිලක කේ.ඩී. හෙසජ්ජමඤ්ජුසාව, 108 පිටුව, 1962
25. -එම-
26. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 524, පිටුව, බු.ජ.ත්‍රි.
27. ලංකානන්ද හිමි ලබුගම, ත්‍රිපිටකයේ භෙසජ්ජ සමුච්චය, 16 පිටුව
28. අෂ්ටාංග හෘදය සූත්‍ර
29. ම.පා., භෙසජ්ජක්ඛන්ධකය, 526 පිටුව, බු.ජ.ත්‍රි.
30. -එම-
31. ධම්මානන්ද හිමි තලල්ලේ, ත්‍රිපිටකයේ සංස්කෘතික ලක්ෂණ, 597 පිටුව
32. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 528 පිටුව, බු.ජ.ත්‍රි.
33. -එම-, 528-530 පිටු
34. කුලතිලක කේ.ඩී. හෙසජ්ජමඤ්ජුසාව, 727 පිටුව, 1962
35. ලංකානන්ද හිමි ලබුගම, ත්‍රිපිටකයේ භෙසජ්ජ සමුච්චය, 24 පිටුව
36. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 530 පිටුව, බු.ජ.ත්‍රි.
37. -එම-
38. -එම-
39. -එම-
40. කුලතිලක කේ.ඩී., හෙසජ්ජමඤ්ජුසාව, 761 පිටුව, 1962
41. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 532 පිටුව, බු.ජ.ත්‍රි.
42. -එම-
43. සමන්තපාසාදිකාව, මහාවග්ග වණ්ණනා, 811 පිටුව, 1946
44. බුද්ධදාස. ආර්, චරක සංහිතා සිංහලානුවාදය, 90 පිටුව, 1960
45. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 532 පිටුව, බු.ජ.ත්‍රි.
46. රාජවෛද්‍ය, උභයශේඛර, ආයුර්වේද ව්‍යාකරණය, 159 පිටුව, 1981
47. ම.පා., භෙසජ්ජක්ඛන්ධකය, 532 පිටුව, බු.ජ.ත්‍රි.
48. සමන්තපාසාදිකාව, මහාවග්ග වණ්ණනා, 811 පිටුව, 1946
49. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 534 පිටුව, බු.ජ.ත්‍රි.
50. -එම-
51. ම.පා. 2, චීවරක්ඛන්ධකය, 684-686 පිටු, බු.ජ.ත්‍රි.
52. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 534 පිටුව, බු.ජ.ත්‍රි.
53. -එම-
54. -එම-

55. -එම-
56. සමන්තපාසාදිකාව, මහාවග්ග වණ්ණනා, 811 පිටුව, 1946
57. ලංකානන්ද හිමි ලබුගම, ත්‍රිපිටකයේ භෙසජ්ජ සමුච්චය, 32 පිටුව
58. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 534 පිටුව, බු.ජ.ත්‍රි.
59. ම. නි. 1., මහාධම්මසමාදාන සූත්‍රය, 740 පිටුව, බු.ජ.ත්‍රි.
60. සමන්තපාසාදිකාව, මහාවග්ග වණ්ණනා, 811 පිටුව, 1946
61. ම. පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 534 පිටුව, බු.ජ.ත්‍රි.
62. කුලතිලක කේ.ඩී., භෙසජ්ජමඤ්ජුසාව, 679 පිටුව
63. ම. පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 536 පිටුව, බු.ජ.ත්‍රි.
64. -එම-, 542 පිටුව
65. සමන්තපාසාදිකාව 1, දුතිය පාරාජිකා වණ්ණනා, 342 පිටුව
66. -එම-
67. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 542 පිටුව, බු.ජ.ත්‍රි.
68. සමන්තපාසාදිකාව 1, දුතිය පාරාජිකා වණ්ණනා, 283 පිටුව
69. කුලතිලක කේ.ඩී., භෙසජ්ජමඤ්ජුසාව, 116 පිටුව
70. ම. පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 552 පිටුව, බු.ජ.ත්‍රි.
71. කුලතිලක කේ.ඩී., භෙසජ්ජමඤ්ජුසාව, 493-494 පිටු
72. -එම-, 493 පිටුව
73. ඤාණසීහ හිමි හේන්පිටගෙදර, ඛන්ධක විනය, 218 පිටුව
74. ස. නි. 5-1 ගිලාන සූත්‍රය, 164 පිටුව, බු.ජ.ත්‍රි.
75. -එම-, දුතිය ගිලාන සූත්‍රය, 164 පිටුව
76. -එම-, තතිය ගිලාන සූත්‍රය, 164 පිටුව
77. ම.පා. 2, භෙසජ්ජක්ඛන්ධකය, 528 පිටුව, බු.ජ.ත්‍රි.
78. -එම-, 556-560 පිටු
79. -එම-, 594 පිටුව
80. -එම-, 620 පිටුව
81. -එම-, 622 පිටුව
82. -එම-, 614 පිටුව
83. -එම-, 562 පිටුව
84. ම.නි. 2, සේඛ සූත්‍රය, 30 පිටුව, බු.ජ.ත්‍රි.
85. අ.නි. 3, 5, 1, 3, 9, 44 පිටු, බු.ජ.ත්‍රි.